C
376

# සර්වෝදය ව්‍යාපාරයෙන් ඉටුවන ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපන සේවාව

තිලකසිරි ගිල්බට් ලංකා

1. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (දෙවනපෙළ) (B. A.)
2. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා(සම්මාන)(Dip. Ed)
3. ශාස්ත්‍රපති (සිංහල) (M. A.)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව
විද්‍යාලයේ 1982 වර්ෂයේ
ශාස්ත්‍රපති පශ්චාත් උපාධි පරීක්ෂණය
(අධ්‍යාපනවිද්‍යා) (M.A) සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනයයි.

පර්යේෂණ උපදේශක –
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. පී. ලියනගේ මහතා

367472

ලබා ගත් කරුණු ඇසුරු කර ගතිමි. ඉන් පසුව සර්වෝදය මූලස්ථානයේ නැවතී, සර්වෝදය සේවක සේවකයන් සමඟ ජීවත් වෙමින් ඔවුන්ගෙන් ලබාගත් අදහස් ආශ්‍රය කරගතිමි. සර්වෝදය නායක ඒ.ටී. ආරියරත්න මහතා ගේ මග පෙන්වීම යටතේ සර්වෝදය ප්‍රජා සංවර්ධන අධ්‍යාපන අංශය භාර අධ්‍යක්‍ෂතුමා හා එම කාර්‍ය මණ්ඩලය සමග දින ගණනක් සාකච්ඡා කර ලබා ගත් කරුණුද, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ ප්‍රධාන ලේකම් විලියම් කන්දගේ මහතාගේ මග පෙන් වීම යටතේ සාකච්ඡා කර ලබා ගතු කරුණුද මෙයට මූලාශ්‍රකර ගතිමි.

මීට අමතරව සර්වෝදය දිස්ත්‍රික්ක මධ්‍යස්ථාන විශේෂයෙන් මහනුවර, කෑගල්ල, කුලියාපිටිය, තණමල්විල සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථාන ඇසුරු කරගෙන කරන ලද විමසීම් වලින් ලබාගත් කරුණුද මෙයට ඇසුරු කරගතිමි. ඒ අතර ප්‍රාදේශීය වශයෙන් ගම්බද මවු හවුල්, යොවුන් හවුල්, ගොවි හවුල් හා පූර්ව පාඨශාලා ද රාශියක් අධ්‍යයනයෙන් හා සාකච්ඡා වෙන්ගෙන් ලබා ගත් කරුණු ඇසුරු කර ගතිමි.

සර්වෝදය ව්‍යාපාරය සම්බන්ධයෙන් දේශීය, විදේශීය විචාරකයන් විසින් ලියන ලද කෘතිද හැකි පමණින් මෙම කෘතිය සඳහා ආශ්‍රය කර කරුණු ලබාගතිමි. මීට අමතරව නොවිධිමත් අධ්‍යාපනය සම්බන්ධයෙන් සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය විසින් දියත් කරනු ලබන ෂ ප්‍රායෝගික වැඩ සටහන් නිරීක්‍ෂණය කිරීමෙන් ලබාගත් කරුණු ද මේ සඳහා උපයෝගී කරගතිමි.

<u>සමාලෝචනය</u>:

1.04 සර්වෝදය හා අධ්‍යාපනය ගැන විමසීමක් නෙරෙන මෙම අධ්‍යයනයෙන් උත්සාහ ගෙන ඇත්තේ, කාලයක් මුළුල්ලේ රටතුළ විශාල උනන්දුවකින් ගෙන ගිය ස්වේච්ඡා ව්‍යාපාරයක පිය සටහන් හා ක්‍රියා දාමයන්හි දක්නට ලැබෙන අධ්‍යාපනමය ක්‍රියා දාමයන් විමර්ෂණය කොට අගැයීමටය. එහිදී දක්නට ලැබුණු කරුණු වල ඇති අධ්‍යාපනමය අගය මෙයට ඇතුළත් කර ඇත. එහිදී මෙම ව්‍යාපාරය ගොඩ නැගීමට මුල් වූ මූලික අදහස හා පෙළඹීම් වල තිබුණු අධ්‍යාපනමය උනන්දුවද විමශීනයට ලක් විය. ආචාර්‍ය විනෝභාබාවේ විසින් ගත් මගට සමාන මගක් ඒ.ටී. ආරියරත්නයන් ගෙන ඇති බවද දැක්විය යුතුය. විනෝභාබාවේ ලෝක සමාජය ගොඩ නැගීමේ පරමාර්ථයෙන් මිනිසුන් අතර පවත්නා විවිධ භේද මග හැරවීමට ගන්නා ප්‍රයත්න-

-යක් ලෙස "භූදාන" ව්‍යාපාරය ආරම්භ කළේය. එලෙසම "සර්වෝදය" යන වචනය ආරියරත්නයන් විසින් භාවිතයට ගෙන සර්වෝදය සංවිධානය ගොඩනගා ඇත්තේ ද එකී පරමාර්ථයෙන් බව පැහැදිලිය. මෙසේ ගොඩනගාගත් සර්වෝදය ව්‍යාපාරය ආර්ථික සංවර්ධනයේදී පැන නැගිය හැකි ගැටළු අවධාරණය කරමින් මනුෂ්‍ය අවශ්‍යතා සපුරා ලීම සඳහා භාණ්ඩ හා සේවා පමණක් නොව, ආචාර සමාචාර විධි හා ආගමික ඉගැන්වීමේ දී අවශ්‍ය බව මෙම අධ්‍යාපනය මගින් පෙන්වා දීමට වෙහෙස දරා ඇත.

එක අතකින් සර්වෝදය ව්‍යාපාරය තුළ හැසිරීම, දින චරියාව, කථාබහ ගොඩනැගිලි හා වටා පිටාව පවා සකසා ඇත්තේ ඉන් අධ්‍යාපනයක් ලබාගත හැකි අයුරිනි. ඉන් ප්‍රජාවට අනියමින් අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාව ලැබේ. පසු ගිය දසක දෙක තුළ සර්වෝදය වඩ වඩාත් අවධානය යොමු කර තිබුණේ අධ්‍යාපන කටයුතු දෙසය. එහෙත් වර්තමාන තත්ත්වය මත සංවර්ධනය හා අධ්‍යාපනය යන තේමාව යටතේ ආර්ථික සංවර්ධනය පැත්තට වැඩි නැඹුරුවක් තිබෙන බව දක්නට ලැබේ. එය අන්තය වෙත ඉක්මන් නැඹුරුවකි. ආරියරත්නයන් සඳහන් කරන පරිදි දේශපාලකයන්ට මෙන් හදිස්සියක් සර්වෝදය සේවකයාට නැතත්, පුද්ගල සංවර්ධනය හැම අතින්ම සිදු නොකොට ආර්ථික සංවර්ධනයට නැඹුරුවීම කාලෝචිතද යන ප්‍රශ්නය වර්තමාන සමාජ තත්ත්වය මත පැණ නගිනු ඇත.